ඔබ අතුරින් කිසිවකු හෝ ඔහුගේ ශරීරයේ නිරෝගී භාවයෙන් යුතුව ඔහුගේ පිරිස අතර සුරක්ෂිතව, ඔහු සතු ඔහුගේ දෛනික ආහාරය ලබා අවදි වූයේ ද මුලු ලෝකයම ඔහු සන්තකයට පත් වූවාක් මෙනි

අල්ලාහ්ගේ දූතයාණන් (සල්ලල්ලාහු අලයිහි වසල්ලම්) ප්රකාශ කළ බව උබෙයිදුල්ලාහ්
ඉබ්නු මිහ්සන් අල්-අන්සාරී (රළියල්ලාහු අන්හු) තුමා විසින් මෙසේ වාර්තා කරන ලදී:
"ඔබ අතුරින් කිසිවකු හෝ ඔහුගේ ශරීරයේ නිරෝගී භාවයෙන් යුතුව ඔහුගේ පිරිස අතර සුරක්ෂිතව, ඔහු සතු ඔහුගේ දෛනික ආහාරය ලබා අවදි වූයේ ද මුලු ලෝකයම ඔහු සන්තකයට
පත් වූවාක් මෙනි."
[حسن] [رواه الترمذي وابن ماجه]

අහෝ මුස්ලිම්වරුනි! ඔබ අතරින් කවරෙකු හෝ ඔහුගේ ශරීරයේ ලෙඩ රෝගවලින් තොර ව නීරෝගීව හා ඔහුගේ පවුල තුළ, ඔහුගේ දරුවන් තුළ, ඔහු යන එන මාර්ගයේ කිසිදු බියකින් තොරව ආරක්ෂිතව ඔහු අවදි වී, ඔහු සතුව දෛනික අනුමත ආහාරවේල ලබා ඇත්තේ ද එය ඔහුට මොලොව මුළුමණින්ම ඒකරාශී කර දෙනු ලැබුවාක් මෙනි.

http://sunnah.global/hadeeth/si/show/5840